---

**පොල් සංවර්ධන අධිකාරිය - 2013**

පොල් සංවර්ධන අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 43 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවධානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවධානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට පොල් සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

අධිකාරියේ ස්ථාවර වත්කම් විවිධ වර්ෂවල ප්‍රත්‍යාගණනය කර ඇති අතර එම වත්කම් ප්‍රත්‍යාගණනය කරන ලද ක්‍රමවේදය පිළිබඳ තොරතුරු ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය ගණනය කිරීමේදී ගොඩනැගිලි ක්ෂය රු.825,820 කින්, කාර්යාල උපකරණ ක්ෂය රු.217,354 ක් වැඩියෙන් සහ රසායනාගාර උපකරණ ක්ෂය රු.68,682 ක් අඩුවෙන්ද ගණනය කර තිබුණි.

**2.3 ලැබිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් 2006 වර්ෂයේදී ගොවිජන සමාගමක් වෙත රු.2,000,000 ක ණය මුදලක් ලබා දී තිබුණු අතර, ගිවිසුම් ප්‍රකාරව ණය ප්‍රදානය කළ දින සිට මාස 06 ක් ඇතුළත පොළී රහිතව සමාන වාරික වලින් ගෙවා නිම කළයුතු වුවත් අවස්ථා 02 කදී රු.550,000 ක් පමණක් ගෙවා තිබුණු අතර, රු.1,450,000 ක හිඟ මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(ආ) අධිකාරියේ නිලධාරියෙකු අයථා ලෙස පරිහරණය කරන ලද මුදල හා ඊට අදාළ පොළිය වූ රු.1,752,462 ක් 1998 වර්ෂයේ සිට දිගින් දිගටම අයවිය යුතු ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ) දිසිදි පොල් මෝල් හිමියන්ගෙන් අයවිය යුතු ගාස්තු සහ නැවුම් පොල් හා කොප්පරා වෙන්දේසි කටයුතු වෙනුවෙන් අයවිය යුතු බිම් කුළිය රු.2,756,691 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතුව තිබුණි.

**3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.36,419,413 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.9,681,156 ක් හා සසඳන විට මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.46,100,569 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම් පෙර වර්ෂයට සාපේක්ෂව රු.36,347,521 කින් අඩුවීම, මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

අධිකාරියේ මුළු ආදායමෙන් සියයට 67 ක් භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් ද සියයට 14 ක්, පොළී ආදායමෙන්ද, සියයට 17 ක් මෙහෙයුම් ආදායමෙන් සහ සියයට 2 ක් විවිධ ආදායම් වලින්ද සමන්විත වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්යසාධනය**

සමාලෝචිත වර්ෂය තුළ කාර්යසාධනය අවම මට්ටමක පැවති අවස්ථා පහත දැක්වේ.

(අ) සැකසුම් සංවර්ධන අංශය හා ප්‍රාදේශීය කර්මාන්ත ජාලගත කිරීම තුළින් පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන්ගේ තොරතුරු එක්රැස් කිරීම සඳහා දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම වෙනුවෙන් 2012 හා 2013 වර්ෂයන්හි රු.694,000 ක් වැයකර තිබුණද, මෙම පද්ධතිය සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් ස්ථාපිත කර නොතිබුණි.

(ආ) කප්රුක පුරවර ගම්මාන වල පවතින හඳුනාගත් පොල්තෙල් මෝල්වල තත්ත්වය ඉහළ නැංවීම සඳහා මෝල් 37 ක් නවීකරණය කිරීමට සැලැසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් මේ සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන ජාත්‍යන්තර වෙළඳපළට හඳුන්වාදීම සඳහා රු.3,471,975 ක් වැය කර සමාලෝචිත වර්ෂයේදී ජර්මනියේ පැවත්වූ වෙළඳ ප්‍රදර්ශනයේදී, රු.මිලියන 80 ක ඇණවුම් ලබාගැනීමට අපේක්ෂා කර තිබුණත් එහි ප්‍රගතිය සමාලෝචනය කර නොතිබුණි.

(ආ) නිපයුම් පියස මධ්‍යස්ථානවල ප්‍රධාන නිෂ්පාදනයක් වන බුරුසු නිෂ්පාදනය සඳහා උසස් තත්ත්වයේ බ්‍රිස්ටල් කෙඳි ලබා ගැනීම පිණිස රු.640,000 කට මිලදීගත් ආරක්ෂිත පොල් ලෙලි දමන යන්ත්‍රය සහිත සාම්ප්‍රදායික පෙට්ටි කුට්ටමක් 2014 නොවැම්බර් 20 දින දක්වාම කාර්මික සංවර්ධන මණ්ඩලයේ රඳවා තබා තිබුණි.

(ඇ) කප්රුක නිපැයුම් දිරිය ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී අධිකාරියේ ලියාපදිංචි නොවූ කර්මාන්තකරුවන් තිදෙනෙකුට රු.2,600,000 ක ණය මුදලක් සඳහා පොළී සහන ලබාදී තිබුණු අතරම, එක් අවස්ථාවකදී ලබාගත් මුළු මුදලම උපයෝජනය කර නොතිබියදී සම්පූර්ණ ණය මුදලටම පොළී සහන ලබාදී තිබුණි.

**4.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 166 ක්ද තථ්‍ය සංඛ්‍යාව 132 ක්ද වීමෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අදාළ වන තනතුරු 34 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පුරප්පාඩුව පැවතුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) අරමුදල් උපයෝජනය
(ආ) ලැබිය යුතු ගිණුම්